දිවයින Online EDITION



## සන්ධානයේ හා ශ්‍රීලනිපයේ මහලේකම්වරු ඉවත් කිරීම සදාචාරාත්මක නැහැ

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

ජයසූරිය උඩුකුඹුර

ඉකුත් මැතිවරණයේ ඡන්ද විමසීමට දින දෙකකට කලින් එජනිස හා ශ්‍රීලනිප ලේකම්වරුන් එම තනතුරුවලින් ඉවත් කිරීම නොකළ යුතුව තිබුණා යැයි එවෙලේ එවැන්නක් සිදු කිරීම සදාචාරාත්මක නොවන බවද පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ඊයේ 19 දා පෙරවරුවේ කොළඹ දී පැවැති මාධ්‍ය හමුවකදී මාධ්‍යවේදියකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඔහු මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ හෙට්ටිආරච්චි මහතා මෙසේද කීවේය.

ශ්‍රීලනිප හා එජනිස ලේකම්වරු එම තනතුරුවලින් ඉවත් කිරීම පක්ෂ අභ්‍යන්තර ක්‍රියාවක් විදියටයි අපි දකින්නෙ. එවැනි ක්‍රියාවන්ට මැදිහත් වෙන්න අපිට බෑ. නමුත් පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද විමසීමට දින දෙකක් තිබියදී එසේ කිරීම සදාචාරාත්මක නොවන බවද ඔහු සඳහන් කළේය.